*ප්‍රශ්නය : ස්වාමින්වහන්ස, ශ්‍රී රෝහණ සංඝ සභාවේ ඉතිහාසය පිළිබඳව විග්‍රහයක් කරන්න පුළුවන්ද?*

පිළිතුර : ශ්‍රී රෝහණ සංඝ සභාවේ ආරම්භ කළේ 1981 අප්‍රේල් මස 2 වැනිදා. ආරම්භක කර්තෘ, පුරාවිද්‍යා චක්‍රවර්ති රාජකීය පණ්ඩිත කඹුරුපිටියේ වංශරතනාභිධාන මහා නායක ස්වාමින් වහන්සේ. උන්වහන්සේ කිහිපනමක සමඟ සාකච්ඡා කොට, පසුව මාතර, ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල සම්භාවණීය යතිවරයාණන් වහන්සේලාට අවශ්‍ය කරුණු සාකච්ඡා කර ගැනීම සඳහා ඌරාපොළ සිරි රතන ජෝති පිරිවෙනට පැමිණෙන ලෙස ආරාධනාවක් කළා. එම ආරාධනාවට ස්වාමින් වහන්සේලා තිස් දෙනමක් සහභාගි වුණා. ඒ අවස්ථාවේදී උන්වහන්සේ, රුහුණු ප්‍රදේශයේ සිටින මහා සංඝයා වහන්සේ සමඟ එකතුවී මහා සංඝයා වහන්සේලාගේ අවශ්‍යතාවයන් රජයට ඉදිරිපත් කිරීමට, සංඝයාවහන්සේලාගේ ප්‍රධානත්වයෙන් යම්කිසි සංවිධානයක් ගොඩ නැගිය යුතුය යන අදහස සඳහන් කර සිටියා.

වැඩම කර සිටි මහා සංඝයාවහන්සේ සියලු දෙනාම ඒ අදහසට කැමති වුණා. ශ්‍රී රෝහණ සංඝ සභාව ආරම්භ කිරීමට මුල් පියවර තැබූ දිනය එදිනයි. 1986 අප්‍රේල් මාසයේදී ප්‍රථම උපසම්පදාව ඌරාපොළ සිරි රතනජෝති පිරිවෙනේදී සිදුකළා. තිස්පස් නමක් පමණ එදා උපසම්පදාව ලැබුවා.

මුලස්ථානට ගොස් උපසම්පදාව ලබා ගැනීමේ ආර්ථික වශයෙන් එදා බොහෝ දුෂ්කර වීම මෙවැනි සංඝ සභාවක් ආරම්භ කිරීමට තවත් ප්‍රධානතම හේතුව වූවා. විශාල මුදලක් හා දින දෙකක පමණ කාලයක් උපසම්පදාව සඳහා ගත කරන්න සිදු වෙනවා. උපසම්පදා අපේක්ෂකයින්ගේ ගුරුවරුන්, දායකයින්, සහෝදරයින්, ඥාතීන් එකට එකතුවෙලා උපසම්පදා ස්ථානයට යන්න ගිය විට එය විශාල දුෂ්කරතාවයක්. ප්‍රාදේශීය වශයෙන් මෙම උපසම්පදාව සිදු කිරීමට බලාපොරොත්තු වුයේ ඒ නිසයි. විනයානුකූලව කිසිදු විරෝධයක් නැහැ. ඒ ඒ ප්‍රදේශවල උපසම්පදාව සිදු කර ගන්නා ලෙස බුද්ධ කාලයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කළා. සියම, බුරුමය ආදි ථෙරවාදි රටවලත් මෙසේ උපසම්පදාව සිදු කරනවා. නමුත් අපේ ව්‍යවස්ථාවක්, කථිකාවතක් තිබුණා රාජකීය අනුග්‍රහය නොමැතිව කැමති කැමති තැන් වල උපසම්පදාව නොකළ යුතුයි කියලා. එය රජතුමාගේ නියෝගය. ඒ නිසාම වරින් වර උපසම්පදාව නැති වී ගියා.

උපසම්පදාව නැතිව ගියාට පසු කිහිප වතාවක්ම වෙනත් රටවල් වලින් උපසම්පදාව ගෙන එන්න සිදු වුණා. එයට බලපෑ ප්‍රධානතම හේතුව එකම තැනක උපසම්පදාව කළ යුතුයි කියන නියමය. නමුත් විනයානුකූලවත්, යුක්ති සහගතවත් එය වැරදි මතයක්. ඒ නිසා අපි කාගේත් කැමැත්තෙන් මේ උපසම්පදාව සිදුකරනවා. රාමඤ්ඤ, අමරපුර ආදි නිකායයන් ද ඒ තැන් වල උපසම්පදාව කරනවා.

''ශ්‍රී රෝහණ උපසම්පදාව'' මෙය රජය අනුමත කළා. කිසිම ප්‍රශ්නයක් නැහැ. නිත්‍යානුකූලව රජයේ අනුග්‍රහය ලැබෙනවා. අද අපේ සංඝ සභාව ආණ්ඩුව පිළිගත් ආයතනයක්. රෝහණ සංඝ සභාව කියන්නේ මේ රටේ ඉන්න උගත්, බුද්ධිමත් යතිවරයාණන් වහන්සේලාගේ එකතුවක් කියන බවට මේ රටේ කාගේත් පිළිගැනීමක් තිබෙනවා. පසුගියදා මාතර පරෙයිදූවේ ශ්‍රී රෝහණ උපෝසථාගාරයේදී විසිවැනි උපසම්පදාව පැවැත්වූවා. පටන් ගත්තේ රෝහණ සංඝ සභාව, රුහුණට පමණයි. නමුත් දැන් සංඝ සභාව ව්‍යාප්ත වෙලා. ඌව, කොළඹ, අනුරාධපුර ආදි ප්‍රදේශ වල ඇත්තන් අපේ සංඝ සභාවට පැමිණ උපසම්පදාව කරන්න කැමතියි

*ප්‍රශ්නය : රුහුණ හා බුද්ධ ශාසනයයි අතර ඓතිහාසික සම්බන්ධතාවයක් තිබෙනවා. ඒ පිළිබඳ කෙටියෙන් සඳහන් කරන්න පුළුවන්ද?*

පිළිතුර : රෝහණ සංඝ සභාව කී විට, පැරණි බෙදීම අනුව සෙංකඩගල නුවර, මහියංගනය, මුතියංගනය යන සියලුම ස්ථාන රුහුණට අයිතියි. නමුත් අද රුහුණ ලෙස පිළිගන්නේ දකුණු පළාත. නමුත් එහි ගැටළුවක් නැහැ. බුදු දහම සමඟ රුහුණට ඇති සම්බන්ධය වැදගත්. මහින්දා ගමනයට පසු සංඝමිත්තා තෙරණින් වහන්සේ විසින් ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ශ්‍රී ලංකාවට වැඩම කළා. ඒ මහා උත්සවයට රුහුණින් - කතරගම හා චන්දනගාම ක්ෂත්‍රියයන් අනුරාධපුරයට ගියා. ඒ අවස්ථාවේදී අෂ්ඨඵල බෝධීන් වහන්සේලා දෙනමක් ඒ ස්ථාන දෙකට දුන්නා. ඒ වන විටත් රුහුණේ බුදු දහම පිළිගත් අය ජීවත් වෙන්න ඇති. නැතිනම් බුදු දහම පිළිබඳ අවබෝධය සහිත, අනුරාධපුරයට සම්බන්ධ අය සිටින්න ඇති. ඒ කාලයේ සිටම රුහුණ සමඟ බුදු දහම සම්බන්ධයි. ඒ වගේම තව කාරණාවක්, දෙවනපෑතිස්ස රජ සමයේ තමයි මාගම රාජධානිය ඇති වුණේ. කාක වර්ණ තිස්ස නොහොත් කාවන්තිස්ස මාගම රාජධානියේ ස්වර්ණමය යුගය ලෙස හඳුන්වන්න පුළුවන්. මිරිසවැටිය චෛත්‍යයේ උත්සව අවස්ථාවේදී

රුහුණින් භික්ෂුණීන් වහන්සේලා 14,000 නමක් අනුරාධපුරයට වැඩම කළ බව සඳහන් වෙනවා. ඒ වගේම ඉගෙනීම සඳහා අනුරාධපුරයෙන් භික්ෂූන්වහන්සේලා රුහුණට වැඩිය බවත් සඳහන් වෙනවා. අටලොස් භානකයින් හැටියට උගත් භික්ෂූන් වහන්සේලා රුහුණේ වැඩ සිටියා. ඔවුන් ඉතාම උගත් භික්ෂූන් වහන්සේලා පිරිසක්. භානක කියන්නේ දීඝ භානක, මජ්ජම භානක, සංයුක්ත භානක ආදි පොත් පිළිබඳ විශේෂඥ දැනිමක් තියෙන අය. අට්ඨ කථා පිළිබඳ පරිපූර්ණ දැනීමක් තියෙන අය.

ඒ ගැන ඉතිහාසයේ සඳහන් වන්නේ මෙහෙමයි. අනුරාධපුර මහා විහාරයේ ලෝවාමහාපායේ, රන් සණ්ඨාරය හාමුදුරු කෙනෙක් නාද කළා. පාලක ස්වාමින්වහන්සේ ඇහුවා 'ඇයි මේ කියලා'. 'බණ කියන්න' කියලා ඒ ස්වාමින් වහන්සේ පවසා සිටියා. 'ඔබ වහන්සේ අට්ඨ කථා ඉගෙන ගත්තා ද?' කියලා ඇහුවා. 'නැහැ' කියලා කිව්වා. 'එසේ නම් බණ කියන්න අවශ්‍ය නම් වහාම රුහුණට ගිහින් අට්ඨ කථා ඉගෙන ගෙන එන්න' කියලා පාලක ස්වාමින් වහන්සේ කිව්වා. ඒ වගේ දක්ෂතතාවයක් රුහුණේ භික්ෂූන් වහන්සේලාට තිබුණා. අටලොස්භානකයින් ලංකාවටම සිටියේ රුහුණේ. මහා සිව හාමුදුරුවන් ගැන කතා කරන විට, ඒ හාමුරුවන්ගේ උගත්කම, දක්ෂකම හැම අටුවාවකම වාගේ සඳහන් වෙනවා. අටුවාවල ප්‍රවෘත්ති වල හැම විටම රුහුණේ භික්ෂූන් වහන්සේලා, ආයතන ගැන සඳහන්. රුහුණේ ආගමික සම්බන්ධතාවය තියෙන්නේ මේ ආකාරයෙන්. අපි හැම විටම කල්පනා කරන්නේ මහ නුවර සෙංකඩගල නගරයේ වැඩ සිටින දන්ත ධාතුන් වහන්සේ ගැන. ඒ වගේම රුහුණේ තිස්සමහාරාමයේ දළඳා වහන්සේ නමක් තැන්පත් කළ බවක් ද ඉතිහාසයේ සඳහන් වෙනවා. කාවන්තිස්ස රජතුමා විසින් කරවන ලද තිස්සමහාරාමයේ, බුදුරජාණන් වහන්සේගේ වම් දළඳා වහන්සේ නමක් තැන්පත් කර තිබෙනවා කියලා එක්තරා සෙල් ලිපියක සඳහන් වෙනවා. සෝමාවතී චෛත්‍යයේ තවත් දළඳා වහන්සේ නමක් වැඩ සිටිනවා. දැන් ඉතිහාසඥයෝ කියනවා රුහුණේ දළඳා වහන්සේලා දෙනමක් වැඩ සිටිනවා කියලා. එසේ බලන විට නුවර වැඩ සිටින දළඳා වහන්සේ සමඟ ලංකාවේ ශ්‍රී දළඳා වහන්සේලා තුන් නමක් වැඩ සිටිනවා කියලා අපට තීරණය කරන්න සිදු වෙනවා. මේවා ඉතිහාසයේ තිබෙන ප්‍රවෘත්ති, පොත් හා සෙල් ලිපි වල සඳහන් වල සිද්ධි ලෙස අපට කල්පනා කරන්න සිදුවෙනවා.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, ඔබ වහන්සේ පොත් පනහකට ආසන්න සංඛ්‍යාවක් ලියා තිබෙනවා. ''බෞද්ධ සංස්කෘතික ලේඛණ සංග්‍රහය'' දෙස බලන විට ඔබ වහන්සේ*

*නොයෙක් ආකාරයේ අදහස් මෙහි ඉදිරිපත් කර තිබෙනවා. මෙහි සඳහන් එකක් තමයි 'යුතුකම් හා අයිතිවාසිකම්'. ඒ පිළිබඳ අදහස් දක්වන්න පුළුවන්ද?*

පිළිතුර : යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව සාකච්ඡා කරන විට එහි පදනම වන්නේ සිගාලෝවාද සූත්‍රයයි. එහි මුළු සමාජයම කොටස් හයකට බෙදා දක්වනවා. එහි එක කොටසක් තමයි දෙමාපිය, දූදරු සම්බන්ධතාවය. පවුල් ඒකකයේ කුඩාම ඒකකය තමයි මව්පිය දෙදෙනා. දෙමාපියන්ගේ හා දූදරුවන්ගේ සම්බන්ධතාවය දිගින් දිගටම යන විට විශාල පිරිසක් එකට එකතු වෙනවා. පවුල් සංවිධානය බිහි වන්නේ මව, පියා හා දූ දරුවන් එකතු වීමෙන්. දෙමාපියන්ගේ පරම යුතුකම, අපේක්ෂාව තමයි දරුවන් හැදීම. දරුවන් හදන විට යුතුකම් රාශියක් ඉටු කරන්න සිදු වෙනවා. හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න අවශ්‍යයි. ඒ වගේම ගුණ යහපත් කම් කියා දෙන්න අවශ්‍යයි. නියම කාලයේදී තම ධනය පවරා දෙන්න අවශ්‍යයි. මෙන්න මේ ආකාරයේ කරුණු පහකින් යුත් යුතුකම් කොටසක් දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතුයි. ඒවාගේම දරුවන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් කොටසකුත් තිබෙනවා. දෙමාපියන් වයසට ගිය පසු ආහාර පාන ආදිය ලබා දී ඇප උපස්ථාන කළ යුතුයි. දෙමාපියන් වෙනුවෙන් දන්, පින් පමුණුවා කළ යුතු දෙය කිරීම, අයිතිවාසිකම හා යුතුකම යන දෙක ඒකාබද්ධව තියෙන්න අවශ්‍යයි. මේ එකක් පමණක් තිබුණාට මදි. ඒ දේවල් නියමිත ආකාරයෙන් ඉෂ්ඨ නොවෙනවානම් සමාජය අඛණ්ඩව පවතින්නේ නැහැ.

*ප්‍රශ්නය : ''වෙනස් වන ලෝකය අනුව භික්ෂු ආකල්පය කෙසේ සකස් විය යුතුද?'' ග්‍රන්ථය ඔබ වහන්සේ රචනා කළ තිබෙනවා.*

පිළිතුර : අපේ කලින් සමාජය සැලකිල්ල දැක්වූයේ භික්ෂූන් වහන්සේලා ජාතියේ මුර දේවතාවන්, ගුරුවරුන් ලෙසයි. එය අද බොහෝ දුරට ඈත් වෙලා. ගිහි පැවිදි සම්බන්ධය බොහෝ දුරට ඈත් වෙලා තිබෙන නිසා, සමාජය බොහෝම දූෂණය වෙලා. ගමේ මුලස්ථානය විහාරස්ථානයයි. විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේට ගමේ නායකත්වය තියෙන්න අවශ්‍යයි. එසේ ගමේ නායකත්වය ඇති ආකාරයට උන් වහන්සේගේ උගත්කම, ගුණවත්කම හා සිල්වත්කම තියෙනවානම් ජනතාව උන්වහන්සේ සමඟ එකතු වෙනවා. එසේ නොවුනහොත් තමයි ගැටීමක් ඇති වන්නේ. මම කතා කළේ ඒ ගැනයි.

*ප්‍රශ්නය : ඔබ වහන්සේ අධ්‍යාපනය පිළිබඳ පොත් ලියමින් අදහස් ප්‍රකාශ කර තිබෙනවා. ඒ පිළිබඳව කතා කළොත්?*

පිළිතුර : අධ්‍යාපනය කියන්නේ ඉගැන්වීම. අධ්‍යයනය කියන්නේ ඉගෙනීම. එදා අධ්‍යාපනයේ මුලස්ථානය පන්සල. පෘතුගීසි කාලය වන තෙක්ම අපේ රටේ පැවැතුනේ පන්සල හා භික්ෂූන් වහන්සේලා මුලස්ථානය කර ගත් අධ්‍යාපනයක්. ඉන්පසුව පන්සලට තිබූ තැන පල්ලියට ගියා. භික්ෂූන්වහන්සේට තිබූ තැන වෙනස් වුණා. පසුව සමස්ත අධ්‍යාපන ක්‍රමයම වෙනසට ලක් වුනා. ඒ කරුණු පදනම් කරගෙන අපේ බෞද්ධ ගිහි පැවිදි සම්බන්ධතාවය ඈත් වුණා. දෙමාපියන්ගේ එකම අදහස දරුවන් හොඳට හැදීම. රජයේත් එකම අදහස පුරවැසියන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම. උගත්කමින්, ගුණවත්කමින් හා යහපත් කමින් යුතු පුරවැසියන් තැනීම තමයි රජයේ පරමාර්ථය. අද මෙය බොහෝ දුරට වෙනස් වෙලා. අපේ පැරැණි ගුරු ගෞරවය දැන් බොහෝ ඈත් වෙලා. ගුරුවරයාට ගෞරව කරන්න ශිෂ්‍යයා කැමති නැහැ. ගෞරව කිරීමට තරම් හැඟීමක් ශිෂ්‍යයන් තුළ නැහැ. එයට එකම හේතුව පන්ති ක්‍රමය. ළමයින් කල්පනා කරනවා පාසලේ ගුරුවරයාගෙන් ඉගෙන නොගත්තාට අපිට පංතියෙන් ඉගෙන ගන්න පුළුවන් කියලා. ඒ අයගේ පරමාර්ථය විභාගයෙන් සමත් වීම. අධ්‍යාපනය ගැන අපේ පැරැණිම අදහස වුණේ විනය, හික්මීම ලබා දීම. ගුණයහපත් කමින් යුත් පිරිපුන් මිනිසුන් හැදීම. අද මුදලට වහල් වෙලා කොහොම හරි විභාගයෙන් සමත් වීම ගැනයි කල්පනා කරන්නේ.

*ප්‍රශ්නය : මෙය වෙනස් කරන්නේ කොහොමද?*

පිළිතුර : මෙය වෙනස් කරන්න අමාරු තත්ත්වයට අද පත්වෙලා. අද තියෙන්නේ මුදල් පසුපස හඹායන සමාජයක්. දෙමාපියන්ට අවශ්‍ය කෙසේ හෝ ළමයාව විභාගයෙන් සමත් කිරීම. ළමයාගෙත් අරමුණ විභාගය සමත් වීම මිසක් බුද්ධිය, දැනීම වර්ධනය කර ගැනීම නෙමෙයි. අධ්‍යාපනය, හදවතට සම්බන්ධ කමක් නැහැ. විෂය කරුණු පිළිබඳ දන්නවා. නමුත් ගුණ යහපත් කම් වලින් තොරයි.

*ප්‍රශ්නය : පිරිවෙන් අධ්‍යාපනය දෙස බැලුවහොත්, එහි තත්ත්වය කුමක්ද?*

පිළිතුර : පිරිවෙන් අධ්‍යාපනයත් අද ඒ තත්ත්වය පත් වෙලා. අද පිරිවෙන් අධ්‍යාපනය අවශ්‍ය කර තියෙන්නේ විශ්ව විද්‍යාලයට ගොස් උපාධියක් ලබා ගැනීමට. අපි ඉගෙන ගන්නා කාලයේ පිරිවෙන් අධ්‍යාපනය තිබුණේ වෘත්තියක් කර මුදල් රැස් කිරීමට නෙමෙයි. එක්තරා ආකාරය දැනුමක් ලබා ගැනීමටයි. පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රධාන අදහස එයයි. නමුත් පිරිවෙන් වලින් කරන්නේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය ආකාරයට ඉගැන්වීම. කිහිප තැනක පමණක් සිංහල. පාලි. සංස්කෘත ආදි පෙරදිග භාෂාවල් හා ධර්ම විනය ආදිය උගන්වනවා. කිහිප දෙනෙක් පමණක් ඒවා ඉගෙන ගන්නවා. වැඩි දෙනෙක් විශ්ව විද්‍යාලයට ගිහින් උපාධිය අරගෙන ගුරුවෘත්තයෙහි යෙදෙන්නයි බලාපොරොත්තුව. මුදල ගැන කල්පනා කරනවා මිසක්, වෙන දෙයක් ගැන අද කල්පනා කරන්නේ නැහැ.

*ප්‍රශ්නය : අධ්‍යාපනය හා පිරිවෙන් අධ්‍යාපනයට අද අභියෝගයක් තිබෙනවා. අපි වෙනසක් ඇති කරන්න පටන් ගත යුතු වන්නේ කොතනින් ද?*

පිළිතුර : වර්තමාන සමාජ ක්‍රමය අනුව වෙනස් කිරීම අමාරු දෙයක්. වර්තමානයේ තියෙන්නේ මුදලට වහල් වූ සමාජයක්. එහි බුද්ධිය ලබා ගැනීමට හෝ ඥානය කෙරෙහි අවධානයක් නැහැ. මුළු සමාජයම මුදල් පසුපස ම හඹා යන තත්ත්වයක් තමයි අද තියෙන්නේ.

*ප්‍රශ්නය : ඔබ වහන්සේ කියන්නේ මෙය වෙනස් කරන්න අමාරු වෙයි කියලාද?*

පිළිතුර : ඔව්, වෙනස් කරන්න අමාරු තත්ත්වයක්තියෙන්නේ. පිරිවෙනේ, විශ්ව විද්‍යාලයේදී ඒවා කරන්න පුළුවන් කමක් නැහැ. අද විශ්ව විද්‍යාලවලත්, උසස් අධ්‍යාපන ආයතන වලත් වැඩිපුරම තියෙන්නේ ගැටීම්. දේශපාලනය සම්බන්ධවීම නිසා තමයි එය සිදු වෙලා තියෙන්නේ. සමහර අයට අවශ්‍ය කර තියෙන්නේ ඒ අතරින් වීරයින් වන්න මිසක් හොඳ පුද්ගලයෙක් වෙන්න නෙමෙයි. වෙනස ඇති කරන්න සෑහෙන කැප කිරීමක්, වෙහෙසීමක් වෙන්න සිදුවේවි.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, අධ්‍යාපනය තුළින් දේශපාලනය ඇත් කරන්න ක්‍රමයක් නැද්ද?*

පිළිතුර : දේශපාලනය ඇත් කරන්න අමාරු තත්ත්වයක් තියෙන්නේ. හැම කෙනාටම දේශපාලනයක් තියෙනවා. විශ්ව විද්‍යාලයට ගියත්, වෙන ආයතනයකට ගියත් කවර හෝ දේශපාලන පක්ෂයකට සම්බන්ධතාවයක් ඇති අය ඉන්නවා. දේශපාලනය සම්බන්ධතාවයක් තිබුණාට කමක් නැහැ. ඉගෙන ගන්න කාලය තුළ ඒ ආයතනයේ නීති රීති වලට යටත්ව, අධ්‍යාපනය නිසි ආකාරයෙන් කරනවානම් ප්‍රශ්නයක් නැහැ. එයින් පිට වුණාට පසු ඒ අයට දේශපාලනය කරන්න පුළුවන්.

***ප්‍රශ්නය : අපේ ඉතිහාසය තුළින් අධ්‍යාපනය සම්බන්ධව අපිට ඉගෙන ගන්න අත්දැකීම් තිබෙනවාද?***

පිළිතුර : වර්තමාන අධ්‍යාපනය එදා පැවති මුලික පරමාර්ථයන්ට එකඟව කටයුතු කරනවානම් කිසි ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ.

***ප්‍රශ්නය : අද සමාජයේ දෙමාපියන්ගේ ආකල්ප පිළිබඳ බැලුවිට. එහිදීත් අද සමාජයේ වටිනාකම වෙනස් වෙලා නේද?***

පිළිතුර : දෙමාපියන් අතරත් අද තත්ත්වය එයයි. දෙමාපියන්ටත් අද අවශ්‍ය කොහොම හරි තමන්ගේ දරුවා උපාධිධාරියෙක් හෝ උගතෙක් කිරීම. රටට වැඩදායක, යහපත් පුරවැසියෙකු කිරීම වෙනම කාරණාවක් වෙලා.

***ප්‍රශ්නය : අද පවතින ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමය අපට ගැලපෙනවා කියලා ඔබවහන්සේ හිතනවාද?***

පිළිතුර : එයම තමයි අද විපත්තියට හේතු වෙලා තියෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ වැඩි දෙනාගේ කැමැත්ත. අද වැඩිපුරම ඉන්නේ බුද්ධිමතුන්. ගැඹුරින් සිතන අය නෙවෙයි. හොඳ යහපත් අය ඉන්නේ ටික දෙනයි. ඒ නිසා බුද්ධිමත් අයට ක්‍රියාත්මක වෙන්න හැකියාවක් නැහැ. ''මොඩයෝ බොහෝ ඉන්නවා'' කියලා බුදුරජාණන් වහන්සේත් දේශනා කර තිබෙනවා.

*ප්‍රශ්නය : අපේ ඉතිහාසට, සංස්කෘතියට ගැලපෙන පාලන ක්‍රමයක් හදා ගන්නේ කොහොමද?*

පිළිතුර : අපේ සංස්කෘතියට ගැලපෙන ආකාරයට. බුද්ධිමත්, මනුෂ්‍යත්වය අගය කරන සමාජයක් බිහි කරන්නය අවශ්‍යයි. පංච ශිලය පදනම කරගත් සමාජයක්. පංච ශිලය කියන්නේ කරුණාව, මෛත්‍රිය පදනම් කරගත් දෙයක්. අද අපි පන්සිල් කියනවා මිසක්, හිතට සම්බන්ධ කර ගන්නේ නැහැ. පෙනුමට මිසක්, අවංකව, හදවතට සම්බන්ධ කර ගන්නේ නැහැ.  මේ ගැන හිතුවොත් අපට ගැලපෙන පාලන ක්‍රමයක් සකස් කරගත හැකියි.

*ප්‍රශ්නය : ආසියාවේ අනෙකුත් රටවල් ඉදිරියට යනවා. අපිට ඉදිරියට යන්න නොහැකි වෙලා තියෙන්නේ ඇයි?*

පිළිතුර : සිංගප්පුවරුව, මැලේසියාව වැනි අපිට පසුව නිදහස ලබා ගත් රටවල් බොහෝමයක් අපේ රටට වඩා බොහෝ ඉදිරියට ගිහින්. අපි එන්න එන්නම යන්නේ පහළට. අපේ තියෙන්නේ කුලල් කා ගැනීම. අපිට ඒකාබද්ධ වෙන්න පුළුවන් කමක් නැහැ. එතැන තියෙන්නේ ආත්මාර්ථකාමිත්වය. මෙය පටන් ගත යුතු වන්නේ මුල් තැනින්මයි. මුල් තැන් වල සිටින අය කල්පනා කරලා ඒ අය ඒකාබද්ධ වෙලා, පරාර්ථකාමි හැඟීමෙන්, බොහෝ දෙනාට හිත සුව පිණිස වැඩපිළිවෙලක් ගෙනගියහොත් මිසක් පහළ සිට පටන් ගෙන මෙය කරන්න බැහැ. හැම දෙනාම එකතු වෙන, සමඟිව රට දියුණු කරන සාමුහික වැඩ පිළිවෙලක් ආරම්භ කළ යුතුයි.

*ප්‍රශ්නය : අපේ පැරණි ඉතිහාසය දෙස බැලූ විට අපිට ශක්තිමත් ආර්ථිකයක් තිබුණා. හැම ක්ෂේත්‍රයේම දක්ෂයෝ සිටියා. මෑත කාලයේ අපිට එය නැති වෙලා. ඒ ඇයි?*

පිළිතුර : අපේ ආර්ථික තත්ත්වයට තමයි මෙය වැඩිපුර බලපා තියෙන්නේ. පැරණි කාලයේ අපේ රටේ තිබුණේ කෘෂි ආර්ථික රටාවක්. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි දැහැමෙන් සෙමෙන් ජීවත් වෙන සමාජයක් අවශ්‍යයි. එහෙම පවතින්න මහන්සි වෙලා උපයාගෙන මධ්‍යම ප්‍රතිපදාවකින් ජීවත් වෙනවා නම් සමාජය මේ තත්ත්වයට පත් වන්නේ නැහැ. අද සීමාවක් නැහැ. එන්න එන්නම තියෙන්නේ වැඩි තෘෂ්ණාව. මේ

තෘෂ්ණාව පුද්ගලයන්, කණ්ඩායම්, රටවල් අතර තිබෙනවා. මේ ආකාරයේ මහා තරඟයක් තමයි අද තියෙන්නේ. මේ සේරටම විපත්තිය වෙලා තියෙන්නේ මුදල. එයට රට පිරිහෙන්න බලපෑවා.

*ප්‍රශ්නය : ඔබ වහන්සේගේ අදහස තරඟකාරිත්ව අඩු කරන්න අවශ්‍යයි කියන අදහසද?*

පිළිතුර : සියල්ල මධ්‍යම තත්ත්වයෙන් තිබෙනවානම් හොඳයි. අතීතයේ තිබුණේත් ඔය දෙයමයි. කාමසුඛල්ලිකානුයෝගය. අද යළිත් ඒ තත්ත්වය පත්වෙලා.

*ප්‍රශ්නය : අද මිනීමැරුම්, අපරාධ, මත්ද්‍රව්‍ය ආදි වශයෙන් වන ප්‍රශ්න රාශියක් සමාජයේ තියෙනවා. මෙයට ගත හැකි පියවර කුමක්ද? දඬුවම් වැඩි කළ යුතුද?*

පිළිතුර : වරදට දඬුවම් නොකර බැහැ. නමුත් මිනිසුන් හදන්න මිසක්, පළි ගන්න දඬුවම් කරන්න හොඳ නැහැ. එදත් දඬුවම් කළේ ඒ ආකාරයෙන්. අදත් කළ යුතු වන්නේ එලෙසයි. දඬුවම් අඩු කරන්න හොඳ නැහැ. මනුෂ්‍යත්වය කියන්නේ කුමක්ද කියලා හැම කෙනෙකුටම අවබෝධ කරන්න අවශ්‍යයි. මනුෂ්‍යයන් මිනීමරාගන්නවත්, හොරකම් කරන්නවත් හොඳ නැහැ. මනුෂ්‍යයාගේ අගය වටහාගෙන ජීවත් වෙන්න ඉඩ දෙන්න අවශ්‍යයි.

*ප්‍රශ්නය : ඔබ වහන්සේ සඳහන් කළා කෘෂි කර්මය ගැන මීට වඩා හිතන්න අවශ්‍යයි කියලා. ඒ ගැන ඔබ වහන්සේගේ තවත් ටිකක් පැහැදිලි කළොත්.*

පිළිතුර : එය අපිට වැරදුන තැනක් තමයි. අපේ රටේ ජීවන රටාව වෙනස් වෙලා. කෘෂි කර්මය වෙනුවට වෙළඳ ද්‍රව්‍ය වෙත යොමු වීම නිසා තමයි වැඩිපුරම මේ තත්ත්වය ඇති වෙලා තියෙන්නේ. කෘෂි කර්මය කළ මිනිසුන් නගර වලට ගිහිල්ලා නොයෙක් රැකියාවල් වල යෙදුනා. කෘෂි කර්මය නැති වෙලා ගියා. පිටරටින් එන දේවල් කා බී ජීවත් වෙන්න අවස්ථාව ලැබුණා. වර්තමාන සුනාමි සිද්ධිය නිසා මිනිස්සුන්ට ආහාර පානා ආදි වශයෙන් බොහෝ පහසුකම් ලැබී තියෙනවා. කන්න බොන්න තියෙනවා. ඒ නිසා මිනිස්සු නිකං ඉන්නවා. මිනිස්සුන්ට කන්න බොන්න දිලාම මෙය කරන්න පුළුවන් කමක් නැහැ. මහා යුද්ධ කාලයේදී හාල් එහෙම නොමිලේ ලබාදෙන විට පිං හාල් කියලා

මිනිස්සු ඒවා ගන්න කැමති වුණේ නැහැ. සමහරු ගත්තත් ඒවා ගත්තේ නොපෙනෙන්න ගිහින්. හැංගි හොරා නමුත් අද එය අයිතිවාසිකමක් කරගෙන.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, ඒ ආත්ම ගරුත්වය අද බිඳිලා තියෙන්නේ ඇයි? එය අද සමාජයේ දකින්න නැහැ.*

පිළිතුර : මේ සුනාමි විපත වේලාවේ සමහර රටවල් පිටරට ආධාර අවශ්‍ය නැහැ කියලා ප්‍රකාශ කළා. නමුත් අපි කෑ ගහලා ආධාර ඉල්ල ගන්නවා. මුහුදු බඩ මිනිස්සුන්ට දැන් හොඳට කන්න බොන්න තිබෙනවා. ගෙවල් දොරවල් හැදීම පැත්තකින් තියලා හොඳට කා බී නිකං ඉන්නවා. සමහරු ලැබෙන මුදල් වලින් මත්පැන් පානය කර නිකරුනේ කාලය ගත කරනවා. මේ ලැබෙන දෙයින් ඔවුන්ගේ ජීවිතය සකස් කර ගන්න කල්පනා කරන්නේ නැහැ.

*ප්‍රශ්නය : ඔබ වහන්සේ සඳහන් කළා පිං හාල් පවා එපා කිව්වා කාලයක් තිබුණා කියලා. ඒ කාලය දෙස බලන විට අද අපට වෙලා තියෙන්නේ කුමක්ද?*

පිළිතුර : ඒ කාලයේ තිබු තත්ත්වය අද වෙනස්. දැන් සහනාධාර අයිතිවාසිකමක් කරගෙන. ඒවා ලබා දෙන්නම අවශ්‍යයි. නැත්නම් උද්ඝෝෂණ, පෙළපාලි අපි බත් දුන් පියා කියා සමහර නම්බුනාම දී තිබුණා. මෙය තමයි සමාජ තත්ත්වය.

*ප්‍රශ්නය : අපේ දේශපාලනය තමයි මෙය කරගෙන තියෙන්නේ?*

පිළිතුර : ඔව්. කුමන හෝ උදව්වක් කර ඡන්දය ලබා ගැනීම තමයි අද බලාපොරොත්තුව. පොරොන්දු දෙනවා. නිකං දෙනවා. මිනිස්සු මේ නිසා ඡන්දෙ දෙනවා. මිනිස්සුත් කල්පනා කරන්නේත් වැරදි ආකාරයෙන්.

*ප්‍රශ්නය : මේ ආකල්ප වෙනස් කරන්න ස්වාමින්වහන්සේලාට කරන්න පුළුවන් කවර කාර්ය භාරයක් ද?*

පිළිතුර : මේ ආකල්පය වෙනස් කරන්න නම් අමුතුවෙන්ම තියෙන ක්‍රමය වෙනස් කර ජනතා බුද්ධිමත් කරන්න අවශ්‍යයි. මරා ගන්නේ නැතිව, සාම කාමී විධියට, බුද්ධිය ඇතිව මනුෂ්‍යයන්ට ජීවත් වෙන්න ඉඩ සලසා දෙන්න අවශ්‍යයි. තාවකාලික පොරොන්දු හෝ නිකං දෙනවා වෙනුවට ආත්ම අභිමානය ඇති කළ යුතුයි.

***ප්‍රශ්නය : ඔබවහන්සේ ප්‍රාර්ථනා කරන ආකාරයට අපේ සමාජය තුළ එක පරිවර්තනයක් වෙන්න අවශ්‍යනම්, ඒය කුමක්ද?***

පිළිතුර : මනුෂ්‍යයන්ගේ හිත් හදන්න අවශ්‍යයි. මිනිහා කියන්නේ කවුද? ඒ මිනිහා මනුෂ්‍යයෙක් හැටියට ඉන්න හිටින්න අවශ්‍ය උපකාර කරන්නේ කොහොමද? මේ ගැන අවධානයක් ඇති කරන්න අවශ්‍යයි. මනුෂ්‍යයෙකුගේ ජිවිතයට හානි කරන්නවත්, අයිතිවාසිකම් උදුර ගන්නෙවත් නැති විධියට මිනිහා හදන්න මහන්සි ගන්න අවශ්‍යයි. මගේ ප්‍රාර්ථනාව එයයි.

***ස්තුතියි ස්වාමින් වහන්ස.***